# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 12 දරන මෝටර් වාහන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1975 මාර්තු මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1075 මාර්තු මස 27 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 12 දරන මෝටර් වාහන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1975 මාර්තු මස 17 වන දින]

එල්. ඩී.—ඕ. 36/72.

**මෝටර් වාහන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 12 දරන මෝටර් වාහන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය.*

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) මෝටර් වාහන පනතේ 30 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— *203 වන අධිකාරයේ 30 වන වගන්තිය සංශෝධනය කිරීම.*

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ඉ) ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඉ) බලපත්‍රය ගැනීමට නියමිත ව ඇත්තේ යම් වර්ෂයක් සඳහා ද ඒ වර්ෂයට පෙරාතුව ම වූ වර්ෂයේ දෙසැම්බර් තිස් එක් වැනි දින හෝ එදිනට පෙර එවිය යුතුය ;" ; තවද

(2) ඒ වගන්තියේ අතුරු විධානයෙහි—

(අ) (iii) වන ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(iii) පළමු වරට ශ්‍රී ලංකාවෙහි ලියාපදිංචි කරන ලද මෝටර් වාහනයක් සම්බන්ධයෙන් වූ විට, ඒ වාහනය ලියාපදිංචි කරන ලද දින සිට තෙදිනක් ඇතුළත දී එකී ඉල්ලුම් පත්‍රය එවිය යුතුය ;" ; තවද

(ආ) ඒ අතුරු විධානයේ (iii) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය අන්තර්ගත කිරීමෙන් :—

"(iv) ලොරියක සන්තකය වෙනස්වීමේ දී එසේ සන්තකය වෙනස් වූ දිනයේ සිට තෙදිනක් ඇතුළත දී එකී ඉල්ලුම් පත්‍රය එවිය යුතුය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— *ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.*

*"සන්තකය වෙනස් වීමේදී ලොරි සඳහා අලුත් ආදායම් බලපත්‍ර නිකුත් කිරීම.*

41. යම් ලොරියක සන්තකය වෙනස් වූ විට, ඒ ලොරියේ අලුත් අයිතිකරු විසින්, ඒ ලොරිය සඳහා අලුත් බලපත්‍රයක් ලබාගැනීම පිණිස 30 වන වගන්තියේ විධිවිධානවලට අනුකූල ව ඉල්ලීමක් කළ යුතු අතර, ඒ වගන්තියේ සහ මෙම කොටසේ සෙසු වගන්තිවල විධිවිධාන ඒ අනුව අදාළ වන්නේය.".

ඒ 10798—10,544 (74/11)

ප්‍රධාන ප්‍රඥප්තියේ 225 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 225 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"බලපත්‍ර ගාස්තුව සහ දඩය අය කර ගැනීම සඳහා අණ කිරීමට අධිකරණයට ඇති බලය.

225. (1) 25 (1) වන වගන්තිය උල්ලංඝනය කරමින් මෝටර් වාහනයක් තම සන්තකයේ තබා ගැනීමේ හෝ පාවිච්චි කිරීමේ හෝ වරද සම්බන්ධයෙන් යම් තැනැත්තකු යම් අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ විටක සහ මේ පනත යටතේ ඒ මෝටර් වාහනය වෙනුවෙන් ආදායම් බලපත්‍රයක් සඳහා ගෙවිය යුතු මුදල ද 1971 අංක 38 දරන මුදල් පනතේ 29 වන වගන්තිය යටතේ පැනවිය යුතු දඩය ද සඳහන් කරමින් බලපත්‍ර අධිකාරී විසින් තම අත්සන යෙදූ සහතිකයක් ඉදිරිපත් කරනු ලැබූ විටක, අධිකරණය විසින් ඒ වරද සඳහා පැනවිය හැකි වෙනත් යම් දණ්ඩනයකට අමතර ව එකී මුදලට සමාන මුදලක් ඒ අධිකරණය විසින් පනවන ලද දඩයක් පරිද්දෙන් ඒ තැනැත්තා ගෙන් අයකර ගැනීමට අණ කළ යුතුය. තවද එවැනි යම් මුදලක් ඒ අධිකරණයේ සාමාන්‍ය අධිකරණ බලය පාවිච්චි කිරීමේ දී ඒ අධිකරණය විසින් නියම කරනු ලැබිය හැකි දඩ මුදලේ ප්‍රමාණය ඉක්මවුව ද ඒ නොතකා අයකර ගනු ලැබිය හැකිය. එවැනි සෑම මුදලක්ම අධිකරණය විසින් අයකරගනු ලැබූ කල්හි ඒ මෝටර් වාහනය වෙනුවෙන් වූ ආදායම් බලපත්‍රයක් සඳහා ගෙවිය යුතු ගාස්තුව හා දඩය සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු ආකාරයට ම ඒ මුදල සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතුය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ යම් අණකින් යම් තැනැත්තකු අතෘප්තියට පත් වූ විටක දී, ඒ අණ කිරීමට හේතුව වූ වරදකරු කිරීමට විරුද්ධ ව ඔහු විසින් අභියාචනයක් කරනු ලබන්නේ නම්, එකී අණට විරුද්ධ ව ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනය කළ හැකිය. එවැනි අවස්ථාවක දී, 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන අපරාධ නඩුවලට අදාළ වන තාක් දුරට ඒ විධිවිධාන ඒ අභියාචනයට අදාළ වන්නේය.

(3) යම් මෝටර් වාහනයක් වෙනුවෙන් යම් වර්ෂයක් හෝ යම් වර්ෂයක කොටසක් හෝ සම්බන්ධයෙන් ලබාගැනීමට නියමිත බලපත්‍රය සඳහා ගෙවිය යුතු ගාස්තුවට සමාන මුදලක් සහ දඩ මුදල (1) වන උපවගන්තිය යටතේ කරන ලද අණක් පරිදි නැතහොත් (2) වන උපවගන්තිය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කරන ලද අණක් පරිදි යම් තැනැත්තකුගෙන් අයකර ගනු ලැබුවා වූ ද මහා මාර්ගයක ධාවනය කරවීමට එම මෝටර් රථය සුදුසු වන්නා වූ ද මෝටර් වාහන

වෙනුවෙන් බලපත්‍ර නිකුත් කිරීමට අදාළ මේ පනතේ අනෙක් සියලු නියමයන් ඒ මෝටර් වාහනය සම්බන්ධයෙන් අනුගමනය කර ඇත්තා වූ ද කල්හි, ආදායම් බලපත්‍රය සඳහා වූ අයදුම්පත නියමිත මුදල සහ දඩය ද සමග III වන කොටස යටතේ යථා පරිදි ඉදිරිපත් කරනු ලැබූ විටක පරිද්දෙන් ඒ මෝටර් රථය වෙනුවෙන් ඒ වර්ෂය සඳහා හෝ වර්ෂයක යම් කොටසක් සඳහා ආදායම් බලපත්‍රයක් බලපත්‍ර අධිකාරී විසින් නිකුත් කළ යුතුය.".

5. (1971 අංක 38 දරන පනතින් සංශෝධිත) ප්‍රධාන ප්‍රඥප්තියේ 240 වන වගන්තිය, එහි ඇතුළත් "ආතුර රථය" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 240 වන වගන්තිය සංශෝධනය කිරීම.

'"ගොඩ වාහනය" යන්නෙන්, කෘෂිකාර්මික හෝ ඉදිකිරීමේ හෝ කාර්යයනට අදාළ ව බිම් සමතලා කිරීම, කැණීම, පස් ඉවත ගෙන යාම, වන සංරක්ෂණය හෝ එබඳු වෙනත් යම් වැඩක් හෝ සඳහා ගොඩබිම පාවිච්චිය පිණිස අදහස් කරන ලද්දා වූ ද තත් කාර්ය සඳහා මෝටර් වාහන රෙජිස්ට්‍රාර් විසින් බලය දෙන ලද්දා වූ ද යන්ත්‍රානුසාරයෙන් ක්‍රියා කරවන (ට්‍රේලරයක් ඇතුළු) යම් වාහනයක් අදහස් වේ. එහෙත් පාර තලන රෝලක් ඊට ඇතුළත් නොවේ;'.